# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත

---

[සහතිකය සටහන් කළේ 2008 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 අගෝස්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 20.00 යි. තැපැල් ගාස්තුව : රු. 12.50 යි.

# 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත

[සහතිකය සටහන් කළේ 2008 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.— ඕ. 47/2005

**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා ද, වෘත්තීය තාක්ෂණය පිළිබඳව විශ්වවිද්‍යාලයීය මට්ටමින් උසස් අධ්‍යාපනයක් ලබාදීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබාගෙන ඇති ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තන් හට උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා අවස්ථා සලසාදීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ද: පූර්විකාව.

එවැනි අධ්‍යයන කටයුතුවල නියැලී සිටින තැනැත්තන් විසින් ලබා ගන්නා අධ්‍යාපන සුදුසුකම ශ්‍රී ලංකාව ඇතුළත මෙන්ම ඉන් පිටත දී ද පිළිගැනීමක් ඇති සුදුසුකමක් බවට සහතිකවීම අවශ්‍ය වී ඇති බැවින් ද:

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබාගෙන ඇති තැනැත්තන්හට උසස් අධ්‍යාපන සුදුසුකම් ලබාදීම සඳහා දැනට ශ්‍රී ලංකාව තුළ කිසිදු ආයතනයක් නොමැති බැවින් ද:

එවැනි තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබාගෙන ඇති තැනැත්තන්හට ශාස්ත්‍රීය සුදුසුකමක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීම ජාතික වැදගත්කමකින් යුතු කාරණාවක් වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ වගන්තියේ විධිවිධාන මෙම පනත පාර්ලිමේන්තු පනතක් වන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

2-PL 002640— 3,500 (2007/11)

## I වන කොටස

## වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීම

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය පිහිටුවීම.

**2.** (1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය නමි වූ විශ්වවිද්‍යාලයක් පිහිටවනු ලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර, (1) වන උප වගන්තිය මගින් එයට පවරා දී ඇති නාමයෙන් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ බලය ඇත්තේ ය:—

(අ) සියලු අධිකරණවල දී නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම;

(ආ) සිය කැමැත්ත පරිදි එහි මුද්‍රාව වෙනස් කිරීම;

(ඇ) මිල දී ගැනීමක් මගින් හෝ අන්‍යාකාරයකින් චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ එවැනි යම් මිලදී ගැනීමකින් හෝ යම් ප්‍රදානයක් හෝ පරිත්‍යාගයක්, බදුගැනීමක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකට, විශ්වවිද්‍යාලය වෙත සතු විය හැකි එවැනි යම් දේපළක් ලබා ගැනීම, භාර ගැනීම සහ දැරීම;

(ඈ) විශ්වවිද්‍යාලය මගින් අත්කර ගනු ලබන යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

එසේ වුව ද, එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම සිදු කරනු ලැබුවේ නීතිය මගින් හෝ එම දේපළ විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබූ යම් උචිත සාධන පත්‍රයක් හෝ නියමයක් මගින් පනවන ලද යම් සීමා කිරීමක්, කොන්දේසියක් හෝ තහනම් කිරීමක් උල්ලංඝනය කරමින් නම්, එම විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම අවලංගු විය යුතු ය; සහ

(ඉ) මේ පනත මගින් විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කොට දී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම.

(3) මේ පනත මගින් ප්‍රකාශිතවම අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා ඇත්නම් මිස, විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති, පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

3 විශ්වවිද්‍යාලයේ මුද්‍රාව විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, ඔහු ඉදිරිපිට දී හෝ උපකුලපතිවරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයකු ඉදිරිපිට දී හැර, එම මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. තව ද, නමින් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන්, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එම වෙනත් යම් නිලධරයා විසින් එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය. විශ්වවිද්‍යාලයේ මුද්‍රාව.

## II වන කොටස

## විශ්වවිද්‍යාලයේ අරමුණු සහ බලතල

4 විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ— විශ්වවිද්‍යාලයේ අරමුණු.

(අ) විශ්වවිද්‍යාලීය අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයන් හට නියමිත දක්ෂතා සහ හැකියාවන් මත පදනම්ව, තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන හා වෘත්තීය වැඩසටහන් සඳහා ශිෂ්‍යයන්ගේ ප්‍රගති සංවර්ධනයට සහායවීම;

(ආ) තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ කර්මාන්ත වල සේවය කරන අනාරම්භ පුහුණුව ලබන තැනැත්තන් සඳහා අධ්‍යාපනික පුහුණුව ලබාදීම;

(ඇ) තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා විෂයමාලා ප්‍රවර්ධනය කිරීමෙහිලා සහාය වීම;

(ඈ) විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ඇති මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම;

(ඉ) ජාතික වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයන්ට ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස සුදුසුකමක් ලබා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම;

(ඊ) අඛණ්ඩ වෘත්තීය වැඩිදියුණුව පිළිබඳ ව්‍යාප්ති පාඨමාලා සැපයීම ; සහ

(උ) ඉදිකිරීම්, නිෂ්පාදනය සහ සේවා අංශ සම්බන්ධයෙන්, ආයතනයන් ඇතුළුව මහජනතාව වෙත ව්‍යාප්ත සේවාවන් සැපයීම,

වේ.

විශ්වවිද්‍යාලයේ බලතල.

**5**. මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) ශිෂ්‍යයන් බඳවා ගැනීම සහ විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලැබිය හැකි තාක්ෂණික අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව පිළිබඳ යම් අනුමත අංශයක උපදේශ ලබාදීම ;

(ආ) පර්යේෂණ සඳහා සහ දැනීම වැඩි දියුණු කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා අවස්ථාවන් ලබා දීම;

(ඇ) විභාග පැවැත්වීම සහ ශිෂ්‍යයන්ගේ කාර්ය සාධනය ඇගයීම;

(ඈ) තත් කාර්ය සඳහා සාදනු ලබන යම් ලිඛිත ව්‍යවස්ථාවකට අනුකූලව උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතාවන් ප්‍රදානය කිරීම සහ පිරිනැමීම;

(ඉ) විශේෂිත ආයතන හෝ අධ්‍යයනාංශ පිහිටුවීම;

(ඊ) විශ්වවිද්‍යාලයේ අරමුණු හෝ සම්බන්ධතාවලට සමාන හෝ සාරානුකූලව සමාන අරමුණු හෝ සම්බන්ධතා ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වෙනත් යම් ආයතන සමග ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ ශිෂ්‍යත්වලාභීන් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයෙන් එම ආයතන සමග සම්බන්ධීකරණය වීම;

(උ) විශ්වවිද්‍යාලයෙන් ඉගෙනීම නොලැබූ තැනැත්තන්ට විශ්වවිද්‍යාලයෙන් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ලබා ගැනීමට හැකිවනු පිණිස විභාග පැවැත්වීම සඳහා වැඩ පිළිවෙල සකස් කිරීම සහ එම විභාග සඳහා ඉගැන්වීමේ පාඨමාලා තීරණය කිරීම;

(ඌ) විශ්වවිද්‍යාලය මගින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති තැනැත්තන්ට උසස් අධ්‍යාපනයක් ලබාදීම සඳහා පහසුකම් සැලසීම;

(එ) තත් කාර්ය සඳහා සාදන ලද යම් ලිඛිත ව්‍යවස්ථාවකට අනුකූලව ශාස්ත්‍රීය සභාව සහ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තැනැත්තන් වෙත ගෞරව උපාධි හෝ වෙනත් විශිෂ්ටතා පිරිනැමීම;

(ඒ) විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ කාර්යය සඳහා ඇතුළත් කිරීම, ප්‍රතිනතය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව සහ ශාස්ත්‍රීය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි වූ, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන යම් විශ්වවිද්‍යාලයකදී සහ ශ්‍රී ලංකාව ඇතුළත, රජයට අයත් වූ උසස් අධ්‍යාපන ආයතන සහ වෙනත් තාක්ෂණ හා වෘත්තීය හෝ වෘත්තීමය ආයතනවල දී සමත් වූ විභාග සහ ගතකළ අධ්‍යයන කාලසීමාවන් පිළිගැනීම;

(ඔ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉගැන්වීම් කටයුතු සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සවි කිරීම සහ ඒවා පවත්වා ගෙන යාම;

(ඕ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු, මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ සහකාර කථිකාචාර්ය තනතුරු සහ වෙනත් අනධ්‍යයන තනතුරු ඇති කිරීම;

(ක) තත් කාර්ය සඳහා සාදන ලද යම් ලිඛිත ව්‍යවස්ථාවකට අනුකූලව, සම්මාන, අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම;

(ග) අවස්ථාවෝචිත පරිදි මහජනතාවට හෝ යම් ආයතනවලට සපයනු ලබන යම් ව්‍යාප්ති සේවා සඳහා ගාස්තු අය කිරීම සහ ඒ ආකාරයෙන් උපයන යම් ආදායමක්, විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා යම් නියමාවලි මගින් නියම කර ඇති පරිදි වියදම් කිරීම; සහ

(ච) මේ පනත මගින් පවරා ඇති බලතලවලින් යම් බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සහ 4 වන වගන්තියෙහි සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

## III වන කොටස

## අමාත්‍යවරයාගේ බලතල

අමාත්‍යවරයාගේ වගකීම් සහ බලතල.

6. (1) මෙම පනතෙහි සාමාන්‍ය මෙහෙයවීම සහ එය ක්‍රියාත්මක කිරීම අමාත්‍යවරයාගේ වගකීම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය වගකීම ඉටු කිරීමේ දී, අමාත්‍යවරයා විසින් මුල්‍ය සහ ඉගැන්වීමේ මාධ්‍යය වැනි කාරණාවලට අදාළව අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන ලිඛිත විධාන, කලින් කල මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම ලිඛිත විධානයක්ම, එය නිකුත් කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන සෑම විධානයකටම අනුකූලව ක්‍රියා කිරීම, මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක කිරීමට අදාළව තම වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා, විශ්වවිද්‍යාලයේ පරිපාලනයට අදාළ සියලු කටයුතු හෝ යම් කටයුත්තක් මණ්ඩලය විසින් විමර්ශනය කොට ඒ පිළිබඳව වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව ක්‍රියා කරමින් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වාර්තාවක් ලැබීමෙන් අනතුරුව, (4) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් පවත්වනු ලැබුවේ විශ්වවිද්‍යාලයේ යම් කටයුත්තක් හෝ පරිපාලනය සම්බන්ධයෙන් ද, එම කටයුත්තට හෝ පරිපාලනයට අදාළව අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන ප්‍රතිකාර ක්‍රියා මාර්ග ගන්නා ලෙස, අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත විධාන කළ යුතු ය

ජාතික ආරක්ෂාවට යනාදියට අනතුරුදායක විය හැකි තත්ත්වයන් පවතින අවස්ථාවල දී.

7. විශ්වවිද්‍යාලය තුළ පවතින යම් තත්වයක් ජාතික ආරක්ෂාවට අනතුරුදායක විය හැකි බවට හෝ ජාතික ප්‍රතිපත්ති වලට අහිතකර හෝ හානිදායක විය හැකි බවට හෝ විශ්වවිද්‍යාලයේ නිසි ක්‍රියාකාරීත්වය කඩාකප්පල් විය හැකි බවට හෝ අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක දී, එම තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සියලු පියවර ගන්නා ලෙස ඔහු විසින් මණ්ඩලය වෙත විධාන කරනු ලැබිය හැකි ය.

වැඩ වර්ජන ආදිය ඇතිවන අවස්ථාවල දී අමාත්‍යවරයා විසින් ගතයුතු ක්‍රියා මාර්ග.

8. (1) යම් වැඩ වර්ජනයක්, දොරගුළුලෑමක් හෝ වෙනත් යම් හේතුවක් නිසා විශ්වවිද්‍යාලයේ කටයුතු හෝ පරිපාලනය බරපතල ලෙස කඩාකප්පල් වී ඇති බවත්, විශ්වවිද්‍යාලය යථා තත්වයට පත් කිරීමට විශ්වවිද්‍යාලයේ විවිධ බලමණ්ඩල අපොහොසත් වී ඇති බවත් අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවකදී, විශ්වවිද්‍යාලය යථා තත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පියවර අමාත්‍යවරයා විසින් ගනු ලැබිය හැකි ය. විශ්වවිද්‍යාලය යථා තත්වයට පත්වන තෙක්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අවශ්‍යයයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් සාදනු ලැබිය හැකි ය:—

(අ) විශ්වවිද්‍යාලය වසා දැමීම;

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් යටතේ වූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් වෙනුවට, නිසි බලධරයකු වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කිරීම; සහ

(ඇ) ඉහත සඳහන් කාරණාවලින් යම් කාරණාවකට සම්බන්ධ හෝ ඊට අදාළ වෙනත් යම් කාරණාවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද එවැනි යම් නියමයක් එහි සඳහන් දිනයක සිට බලාත්මක විය යුතු අතර, එම නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය. එම නියමය කලින් පරිච්ඡින්න කරනු ලැබුවහොත් මිස, ඉන්පසු මාස තුනකට නොවැඩි කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

9. (1) එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් පසු මාස හයක කාලයක් ගත වීමට පෙර, විශ්වවිද්‍යාලය විසින් එම වර්ෂය ඇතුළත එහි කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එහි පිටපත් පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි පිටපත් විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීම මත, මහජනතාව වෙත ලබාදීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්

විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්.

**10.** (1) ජනාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා නම් කරනු ලැබිය යුතු ය. කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා විය යුතු අතර, එකී නම් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ඔහු ධුර දැරිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නම් කරනු ලැබූ කුලපතිවරයා පැමිණ සිටින විට දී, ඔහු විශ්වවිද්‍යාලයේ සෑම උපාධි ප්‍රදානෝත්සවයකම මුලසුන දැරිය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) උපකුලපතිවරයා;

(ආ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(ඇ) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඈ) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා;

(ඉ) අධ්‍යක්ෂ, මුදල්;

(ඊ) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම ; සහ

(උ) නිලධරයකු බවට ලිඛිත ව්‍යවස්ථාවක් මඟින් ප්‍රකාශයට පත් කරන ලද තනතුරක් දරන යම් තැනැත්තකු.

උපකුලපතිවරයා.

**11.** (1) මණ්ඩලය විසින් නම් කරන ලද තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත වන මඩුල්ලකින්, ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) ඉදිකිරීම් හෝ නිපදවීම් ක්ෂේත්‍රවල හෝ වෙනත් තාක්ෂණ හෝ සේවා අංශයේ ක්ෂේත්‍රවල ශාස්ත්‍රීය සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින් පුද්ගලයින් තිදෙනකුගෙන් සමන්විත වන මඩුල්ල තෝරා පත් කර ගත යුතු ය.

(3) නොකඩවා ධුර කාල දෙකකට වැඩි සංඛ්‍යාවක් සඳහා උප කුලපතිවරයා වශයෙන් කිසිම තැනැත්තකු පත් කරනු නොලැබිය යුතු ය.

(4) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද විය යුතු ය. ඔහු, මණ්ඩලය සහ ශාස්ත්‍රීය සභාව යන දෙකෙහිම නිල බලයෙන් පත්වන සාමාජිකයකු සහ ඒවායේ සභාපතිවරයා ද වන්නේ ය. විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බලමණ්ඩලයක හෝ නියමාවලි මගින් නියම කරනු ලබන වෙනත් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, ඊට සහභාගි වීමට සහ එහිදී කථා කිරීමට උපකුලපතිවරයාට හිමිකම් ඇති නමුත්, එවැනි යම් බලමණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක ඔහු සාමාජිකයකු වන්නේ නම් මිස, එවැනි රැස්වීමක දී ඡන්දය දීමට උපකුලපතිවරයාට හිමිකමක් නොමැත්තේ ය.

(5) මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා උපකුලපතිවරයා වෙත කලින් කළ නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, මේ පනතේ විධිවිධාන සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථා පරිදි අනුගමනය කරන බවට වගබලාගැනීම උපකුලපතිවරයාගේ කාර්ය වන්නේ ය. එමෙන්ම එම කාර්ය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඔහු විසින් එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ සහ ශාස්ත්‍රීය සභාවේ තීරණ බලාත්මක කිරීම සහ එසේ බලාත්මක කරන බවට වග බලා ගැනීම, උපකුලපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(7) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ගිණුම් නිලධරයා විය යුතු අතර, විශ්වවිද්‍යාලය ඇතුළත විනය පවත්වාගෙන යාම සඳහා ද ඔහු වගකිව යුතු ය.

(8) කලින් ධුරය අත්හලහොත් මිස, හෝ මේ වගන්තියේ (9) වන උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, උපකුලපතිවරයා අවුරුදු හතරක කාලයක් හෝ ඔහුගේ වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කිරීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාව දක්වා, ධුරය දැරිය යුතු ය.

(9) ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා හේතු දක්වා උපකුලපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(10) නිවාඩු ලබා සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා උපකුලපතිවරයාට තම ධුරයේ කටයුතු ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් සුදුසු යයි සලකනු ලබන

වැඩපිළිවෙලක් එම නොහැකියාව සිදුවීමේ දින සිට දින හතක් ඇතුළත ජනාධිපතිවරයා විසින් සකස් කරනු ලැබිය යුතු ය. එවැනි වැඩපිළිවෙලක් සකස් කරනු ලබන තෙක්, එම ධූරයේ එදිනෙදා කටයුතු විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉටුකරගෙන යා යුතු ය.

(11) උප කුලපති ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, ස්ථිර පත්කිරීමක් කරනු ලබන තෙක්, එම ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා එම පුරප්පාඩුව ඇති වූ දින සිට දින හතක් ඇතුළත, ජනාධිපතිවරයා විසින් සුදුසු යයි සලකනු ලබන වැඩපිළිවෙලක් සකස් කරනු ලැබිය යුතු ය. එවැනි වැඩපිළිවෙලක් සකස් කරනු ලබන තෙක්, එම ධූරයේ එදිනෙදා කටයුතු විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉටුකරගෙන යා යුතු ය.

පීඨයක පීඨාධිපතිවරයා.

12. (1) එක් එක් පීඨයට පීඨාධිපතිවරයකු සිටිය යුතු අතර, ඔහු එම පීඨයේ ශාස්ත්‍රීය සහ පරිපාලන ප්‍රධානියා විය යුතු ය. එම පීඨයේ සාමාජිකයන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, අතුරින් ඒ පීඨය විසින් පීඨාධිපතිවරයා තෝරා පත් කර ගත යුතු ය.

(2) උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව ඔහු තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා පීඨයක පීඨාධිපතිවරයා ධූර දැරිය යුතු අතර, ධූරය දැරීම සඳහා නුසුදුසු වුවහොත් මිස, තවත් අවුරුදු තුනක කාලයක් සඳහා නැවත තෝරා පත් කරගනු ලැබීමට ද, ඔහු සුදුස්සකු වන්නේ ය.

(3) මේ පනතේ 55 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ නිලධරයකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුසු පීඨයක පීඨාධිපතිවරයකු, එම ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) නිවාඩු ලබා සිටීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා තම ධූරයේ කටයුතු ඉටු කිරීමට පීඨයක පීඨාධිපතිවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එම කාල සීමාව සඳහා පීඨාධිපති ධූරයේ වැඩ බැලීම සඳහා උපකුලපතිවරයා විසින් එම පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(5) පීඨයක පීඨාධිපතිවරයකු ඉවත්කිරීම, විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් ඔහුට තම ධූරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එම පීඨයේ පීඨාධිපතිවරයාගේ ධූරය පුරප්පාඩු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව නව පීඨාධිපතිවරයකු තෝරා පත් කර ගත යුතු ය. එසේ තෝරා පත් කර ගනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති ධූර කාලය සඳහා එම ධූරය දැරිය යුතු ය.

13 (1) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, තේරීම් කමිටුවක නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම තේරීම් කමිටුවේ සංයුතිය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය. තව ද, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු වශයෙන් ක්‍රියාකළ යුතු අතර විශ්වවිද්‍යාලයේ සහකාර ගිණුම් නිලධරයා ද විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්—

(අ) උපකුලපතිවරයාගේ විධානවලට සහ පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සහ එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ආ) විශ්වවිද්‍යාලයේ වාර්තාවල භාරකාරත්වය සහ එහි දේපළ සඳහා වගකිව යුතු ය ; එමෙන්ම

(ඇ) මේ පනත හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක් මගින් ඔහු වෙත පවරා ඇති හෝ පනවනු ලබන හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම ද කළ යුතු ය.

14. (1) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා, තේරීම් කමිටුවක නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම තේරීම් කමිටුවේ සංයුතිය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය. තව ද, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු වශයෙන් ක්‍රියා කළ යුතු ය. අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා.

(2) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා, විසින් —

(අ) උපකුලපතිවරයාගේ විධානවලට සහ පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ මාධ්‍ය සහ තොරතුරු මධ්‍යස්ථානයේ හෝ

මධ්‍යස්ථානවල සාමාන්‍ය පරිපාලනය සඳහා වගකිව යුතු ය ; එමෙන්ම

(ආ) මේ පනත හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මගින් ඔහු වෙත පවරා ඇති හෝ පනවනු ලබන හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද කළ යුතු ය.

අධ්‍යක්ෂ, මුදල්.

**15**. (1) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මුදල්, තේරීම් කමිටුවක නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි අතර, එම තේරීම් කමිටුවේ සංයුතිය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය. තව ද, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ, මුදල්, විසින්—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ මුදල්වල සාමාන්‍ය පරිපාලනය සඳහා වගකිව යුතු අතර, නියමාවලි මගින් නියම කර ඇති ආකෘතියට අනුව සහ එවැනි ආකාරයට ඔහු විසින් එහි ගිණුම් පවත්වාගෙන යා යුතු ය ; එමෙන්ම

(ආ) මේ පනත හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක් මගින් පවරා ඇති හෝ පනවනු ලබන හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ, මුදල්, විශ්වවිද්‍යාලයේ සියලුම අරමුදල්වල භාරකාරත්වය දැරිය යුතු ය.

අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම.

**16**. (1) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම, තේරීම් කමිටුවක නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම තේරීම් කමිටුවේ සංයුතිය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය. තවද, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම, විසින් —

(අ) උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, ඇතුළත් කිරීමේ නිර්නායක සඳහා සහ විශ්වවිද්‍යාලය මගින් සලසා දෙන පාඨමාලාවල සහ වෙනත් සහායක සේවාවල තත්ත්ව සහතිකවීම සඳහා වගකිව යුතු ය ; එමෙන්ම

(ආ) මේ පනත මගින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මගින් ඔහු වෙත පවරා ඇති හෝ පනවනු ලබන හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද කළ යුතු ය.

## V වන කොටස

## විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල

17. විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල පහත දැක්වෙන පරිදි වේ:— *විශ්වවිද්‍යාලයේ බල මණ්ඩල.*

(අ) පාලක මණ්ඩලය ;

(ආ) ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව ;

(ඇ) ශාස්ත්‍රීය සභාව ;

(ඈ) පීඨ මණ්ඩල ; සහ

(ඉ) විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල ලෙස නියමාවලි මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මණ්ඩල.

18. (1) (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:— *විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය.*

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් :—

(i) උපකුලපතිවරයා ;

(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් නිලධරයෙක් ;

(iv) මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් ;

(v) උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(vi) තාක්ෂණ විද්‍යාලවල කටයුතු විධිමත් කිරීමේ වගකීම භාරව සිටින මණ්ඩලයේ ප්‍රධානියා ;

(vii) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත මඟින් පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා ; සහ

(viii) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මඟින් පිහිටුවනු ලැබූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපතිවරයා ; සහ

(ආ) (මේ වගන්තියේ "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන තැනැත්තන් :—

(i) ශාස්ත්‍රීය සභාවේ සාමාජිකයන් අතරින් එම සභාව විසින් නම් කරනු ලබන එහි සාමාජිකයන් දෙදෙනෙක්;

(ii) (අ) ඡේදයේ (i), (ii), (iii), (iv) සහ (v) වන අනුඡේදවල සහ මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් සාමාජිකයන්ගේ සංඛ්‍යාව යන සංඛ්‍යා දෙකේ එකතුව එකකින් වැඩිකළ විට ඇතිවන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්. මෙම සාමාජික සංඛ්‍යාවෙන් සාමාජිකයන් හතර දෙනෙක් අධ්‍යාපනික, වෘත්තීය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් ඉටුකර ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන එක් එක් සංවිධානයෙන් ලැබෙන නාමයෝජනා දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් තෝරාගනු ලැබූ එක් නියෝජිතයා බැගින්, ඊට ඇතුළත් විය යුතු ය:—

(අ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ;

(ආ) ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය ;

(ඇ) ලංකා වාණිජ මණ්ඩලය ; සහ

(ඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

(2) උපකුලපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම ඔහු මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක දී මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි නම්, පැමිණ සිටින

සාමාජිකයන් විසින් තමන් අතුරින් එක් සාමාජිකයකු එම රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය. විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු කලින් ධූරය අත්හලහොත් මිස, තමා පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා ධූර දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත්කිරීම සඳහා ඔහු සුදුස්සකු වන්නේ ය :

එසේ වුව ද යම් පත්කළ සාමාජිකයෙක් තම ධූරකාලය අවසන් වීමට පෙර ධූරය අත්හලහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති ධූර කාලය සඳහා එම ධූරය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකුට තම අත්සන යටතේ අමාත්‍යවරයා වෙත අමතන ලියවිල්ලක් මගින්, සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මේ පනතේ 55 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලයක අඛණ්ඩව සාමාජිකයකු ලෙස සිටීමට නුසුදුසු වන්නා වූ යම් පත්කළ සාමාජිකයකු, එම ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(6) කවර හෝ හේතුවක් නිසා මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු අඛණ්ඩව මණ්ඩලයේ රැස්වීම් තුනකට පැමිණ නොසිටියහොත්, ඔහු සාමාජිකයකු වශයෙන් සිය ධූරය අත්හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර,(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හයදෙනකු විය යුතු ය.

(9) මණ්ඩලය විසින් අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී රැස්විය යුතු අතර, එක් වර්ෂයක දී වාර දහයකට අඩු නොවන වාර සංඛ්‍යාවක් සඳහා රැස්විය යුතු ය.

(10) මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී හෝ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකකට අඩු නොවන සාමාජික සංඛ්‍යාවක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් තමා වෙත ලැබී එක් සතියක් ඇතුළත, සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**19**. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත මගින් විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතල වල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම් කරනු ලැබිය යුතු ය:—

(i) ශාස්ත්‍රීය සභාව විසින් නිර්දේශිත අධ්‍යයන පාඨමාලා අනුමත කිරීම ;

(ii) ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව විසින් කරනු ලබන යම් නිර්දේශ සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම් සඳහා වූ අවශ්‍යතාවයන් කලින් කල නිශ්චය කිරීම ;

(iii) විශ්වවිද්‍යාලයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(iv) විශ්වවිද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ එහි ආකෘතිය නිශ්චය කිරීම ;

(v) මේ පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාලයට අදාළ සියලු කාරණා පාලනය කිරීම සහ නිශ්චය කිරීම ;

(vi) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අවශ්‍යතා පිළිබඳව කලින් කල විමසා බැලීම හෝ විමර්ශනය කිරීම ;

(vii) එක් අවස්ථාවක දී අවුරුදු තුනකට අඩු නොවන කාලයක් වෙනුවෙන් විශ්වවිද්‍යාලය සඳහා සාංගමික ක්‍රමෝපාය සැලසුම් සහ ඊට අනුරූප අයවැය කලින් කල පිළියෙල කිරීම ;

(viii) ආණ්ඩුවේ සමස්ථ පඩි සහ වැටුප් ප්‍රතිපත්තිය ඇතුළත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණ සහ ඔවුන්ට ලැබීමට හිමිකම් ඇති වෙනත් ප්‍රතිලාභ කලින් කල නිශ්චය කිරීම ;

(ix) යම් නිශ්චිත කාර්යයන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත සුදුසු අන්දමකට පරිහරණය කිරීම සඳහා දී තිබෙන අරමුදල් පරිපාලනය කිරීම ;

(x) රික්තවරණ, පරිත්‍යාග සහ ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාලය වෙත දෙනු ලබන දේපළ ලබා ගැනීම සහ භාර ගැනීම ;

(xi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ එම වාර්තා සහ ගිණුම් අවශ්‍ය යයි සලකනු ලබන යම් සංශෝධන ද සහිතව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(xii) විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන පිළියෙල කිරීම සහ ඒවා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(xiii) මේ පනත යටතේ ලිඛිත ව්‍යවස්ථා සෑදීමට නියමව ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එම කාරණා සඳහා සුදුසු යයි සලකනු ලබන විට දී ලිඛිත ව්‍යවස්ථා සෑදීම ;

(xiv) මේ පනත යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය පවරා ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද එම කාරණා පිළිබඳව අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(xv) විශ්වවිද්‍යාලයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ සහ වෙනත් භාණ්ඩ සැපයීම ;

(xvi) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ කාර්ය සාධනය ඇගයීම ;

(xvii) ශාස්ත්‍රීය සභාව විසින් කරන ලද නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයෙන් හෝ වෙනත් ස්ථානයකින් විභාග පරීක්ෂකවරයන් පත් කිරීම සහ එම විභාග පරීක්ෂකවරයන්ට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම ;

(xviii) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය සුභසාධනයෙහි ප්‍රවර්ධනය සඳහා ශිෂ්‍ය නියෝජිතයන් ද ඇතුළත් විය යුතු සුභසාධක මණ්ඩලයක් පත්කිරීම, එම මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය ;

(xix) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත්වීම, ඒවා පවත්වාගෙන යාම හෝ අවලංගු කිරීම සහ විශ්වවිද්‍යාලය විසින් ජනනය කරනු ලැබ වියදම් නොකළ යම් ආදායමක් ඇතුළු විශ්වවිද්‍යාලයට අයත් යම් මුදල්, ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ මිල දී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ වහාම වියදම් කිරීම සඳහා අවශ්‍ය නොවන එම මුදල්වලින් යම් කොටසක්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද යම් බැංකුවක, ස්ථිර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම ;

(xx) ශාස්ත්‍රීය සභාව විමසා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ, නිලධරයන්ගේ, උපාධිධාරීන්ගේ සහ ශිෂ්‍යයන්ගේ උපාධි නේපථ්‍ය හෝ ලාංඡනය නැතහොත් ඒ දෙකම නිශ්චය කිරීම ;

(xxi) ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව විමසා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු, මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ සහකාර කථිකාචාර්ය තනතුරු පිහිටුවීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම ;

(xxii) ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව විමසා යම් අනධ්‍යයන තනතුරක් පිහිටුවීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම ;

(xxiii) ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව විමසා, (xxi) සහ (xxii) වන ඡේදවල සඳහන් යම් තනතුරක් සඳහා අවශ්‍ය සුදුසුකම් නිර්ණය කිරීම ;

(xxiv) විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සමග සහයෝගිතා සහ හවුල් සම්බන්ධතා ඇති කර ගැනීම ;

(xxv) ශාස්ත්‍රීය සභාවේ නිර්දේශය මත අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(xxvi) ශාස්ත්‍රීය සභාවේ නිර්දේශය මත පීඨ සංඛ්‍යාවක් පිහිටුවීම ; සහ

(xxvii) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක අන්‍යාකාරයකට විධිවිධාන සලසා නොමැති, විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(3) යම් ශාස්ත්‍රීය කාරණයකට අදාළව ශාස්ත්‍රීය සභාවේ මතය වාර්තාගතකොට මණ්ඩලය වෙත ප්‍රේෂණය කිරීමේ අවස්ථාවක්

ප්‍රථමයෙන් දී ඇත්තේ නම් මිස, එම ශාස්ත්‍රීය කාරණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිදු යෝජනා සම්මතයක්, සම්මත කරගනු නොලැබිය යුතු ය.

මේ වගන්තියෙහි "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන්, ශාස්ත්‍රීය සභාවේ පාලනය සහ සාමාන්‍ය විධානයට යටත්වන යම් කාරණයක් අදහස් වේ.

20. (1) මේ පනත යටතේ සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ කිරීමට හැකිවීම පිණිස අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය. නියමාවලි සෑදීමට මණ්ඩලයට ඇති බලය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණාවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය :—

(අ) නියමාවලි මගින් නියම කිරීමට අවශ්‍ය සියලු කාරණා හෝ මේ පනතේ වෙනත් විධිවිධානයක් යටතේ මණ්ඩලයට නියමාවලි සෑදීමට බලය පවරා ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එවැනි කාරණා ;

(ආ) විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි ;

(ඇ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි ;

(ඈ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම උදෙසා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ප්‍රමිතීන් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඉ) විදේශීය උපාධි සහ ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිගැනීම ; සහ

(ඊ) ඉහත සඳහන් කාරණා අතුරින් යම් කාරණයකට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණයක්.

(3) මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන සෑම නියමාවලියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් දිනයේ සිට එම නියමාවලි ක්‍රියාත්මක විය යුතු ය.

ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව

**21.** (1) (මෙහි මින් මතු "තත්ත්ව සහතික සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් :—

(i) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ii) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iii) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව;

(iv) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(v) තාක්ෂණික විද්‍යාලවල කටයුතු විධිමත් කිරීමේ වගකීම භාරව සිටින මණ්ඩලයේ ප්‍රධානියා; සහ

(ආ) (මේ වගන්තියේ "පත්කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් තැනැත්තන් :—

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ii) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හෝ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය නියෝජනය කිරීම සඳහා පත් කරන ලද පත් කළ සාමාජිකයන් අතුරින් අඩු තරමින් එක් අයෙකු හෝ ඇතුළත් වන පරිදි, ස්වකීය පත් කළ සාමාජිකයන් අතුරින් මණ්ඩලය විසින් නම් කරනු ලබන මණ්ඩලයේ නියෝජිතයන් දෙදෙනෙක්;

(iii) ශාස්ත්‍රීය සභාවේ සාමාජිකයන් අතරින් එම සභාව විසින් නම් කරනු ලබන ශාස්ත්‍රීය සභාවේ එක් නියෝජිතයෙක් ; සහ

(iv) ජාතික වෘත්තිය සුදුසුකම් සඳහා සහ ප්‍රතීතනය සඳහා වගකීම සතු, 1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්.

(2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තත්ත්ව සහතික සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු මෙම සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. සභාපතිවරයාට යම් රැස්වීමක මූලසුන දැරීමට නොහැකි වන අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මූලසුන දැරීම සඳහා එසේ පැමිණ සිටින යම් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තත්ත්ව සහතික සභාවේ ලේකම්වරයා විය යුතු ය.

(4) තත්ත්ව සහතික සභාවේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් හරි අඩක් විය යුතු අතර, තත්ත්ව සහතික සභාව අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී රැස්විය යුතු ය. එසේ වුව ද එම සභාව එක් වර්ෂයක දී එක් වාරයකට අඩු නොවන වාර සංඛ්‍යාවක් එසේ රැස්විය යුතු ය.

(5) තත්ත්ව සහතික සභාවේ යම් පත්කළ සාමාජිකයකු කලින් ධුරය අත්හලහොත් මිස, තමා පත් කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු හතරක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා ඔහු සුදුස්සකු වන්නේ ය:

එසේ වුව ද, යම් පත් කළ සාමාජිකයෙක් සිය ධුරකාලය අවසන් වීමට පෙර සිය ධුරය අත්හැර ගියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුරකාලය සඳහා පමණක් ධුර දැරිය යුතු ය.

(6) තත්ත්ව සහතික සභාවේ පත්කළ සාමාජිකයකු තමාගේ අත්සන යටතේ උපකුලපතිවරයා වෙත අමතනු ලබන ලියවිල්ලක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) මේ පනතේ 55 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල බලමණ්ඩලයක අඛණ්ඩව සාමාජිකයකු ලෙස සිටීමට නුසුදුසු වන්නා වූ යම් පත් කළ සාමාජිකයකු, එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(8) කවර හෝ හේතුවක් නිසා තත්ත්ව සහතික සභාවේ රැස්වීම් තුනකට අඛණ්ඩව නොපැමිණෙන එකී සභාවේ යම් පත්කළ සාමාජිකයකු, සාමාජිකයකු වශයෙන් තම ධුරය අත්හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, උපකුලපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(9) තත්ත්ව සහතික සභාවේ යම් පත් කළ සාමාජිකයකුට මුදල් විෂයයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

තත්ත්ව සහතික සභාවේ බලතල

**22.** යම් උචිත වාර්තා සලකා බැලීමෙන් අනතුරුව, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට තත්ත්ව සහතික සභාවට බලය ඇත්තේය:—

(i) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කිරීමේ උපමාන ;

(ii) එක් එක් අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් කළ යුතු ශිෂ්‍ය සංඛ්‍යාව ;

(iii) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම සඳහා සපුරාලිය යුතු ජාතික වෘත්තිය සුදුසුකම් සහ යම් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක් විසින් ප්‍රදානය කරනු ලබන හෝ දෙනු ලබන වෙනත් යම් වෘත්තීය සුදුසුකම් අතරින් තෝරා ගනු ලබන සුදුසුකම් ;

(iv) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වූ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ උපමාන;

(v) පාඨමාලාවල ශාස්ත්‍රීය තත්ත්වය පවත්වාගෙන යාම හෝ උසස් කිරීම සඳහා අදාළ වෙනත් කාරණා ;

(vi) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු, මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ සහකාර කථිකාචාර්ය තනතුරු පිහිටුවීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම ;

(vii) ශාස්ත්‍රීය සභාව සහ කර්මාන්තය විමසා, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා පිළිබඳ ප්‍රතිනන නියමයන් සකස් කිරීම ;

(viii) විශ්වවිද්‍යාලයේ සියලු ගුරුවරුන්ගේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ;

(ix) විශ්වවිද්‍යාලයේ අරමුණු තවදුරටත් ඉටුකර ගැනීම සඳහා වෙනත් ජාතික සහ ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සහ වෘත්තීය මණ්ඩල සමග පිහිටුවනු ලැබිය යුතු සාමූහික සහයෝගිතාවය;

(x) කමිටුව වෙත යොමු කරනු ලැබිය හැකි ස්වකීය බලතලවලට අදාළ යම් කාරණයක් පිළිබඳ පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන ස්වකීය සාමාජිකයන්ගෙන් සමන්විත වන කමිටු සංඛ්‍යාවක් සහ සිය සාමාජිකත්වයට පිටතින් සිටින වෙනත් යම් වෘත්තීය වේදීන්ගෙන් සමන්විත වන කමිටු සංඛ්‍යාවක් පත්කිරීම ; සහ

(xi) නිර්දේශ කිරීම සඳහා මණ්ඩලය විසින් යොමු කළ හැකි වෙනත් යම් කාරණයක්.

**23**. (1) ශාස්ත්‍රීය සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:— ශාස්ත්‍රීය සභාව.

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් :—

(i) උපකුලපතිවරයා ;

(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iii) විශ්වවිද්‍යාලයේ සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් සහ මහාචාර්යවරයෙක් ;

(iv) විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(v) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා ; සහ

(vi) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව ; සහ

(ආ) පහත දැක්වෙන තෝරා පත්කර ගත් සහ පත්කළ සාමාජිකයන්:—

(i) එක් එක් පීඨය නියෝජනය කරමින් එම පීඨවල ස්ථිර ගුරුවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත් කර ගනු ලබන හත්දෙනකුට නොවැඩි සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ප්‍රමාණයක් ;

(ii) එක් එක් පීඨය නියෝජනය වන පරිදි පීඨ මණ්ඩලය විසින් තෝරා පත් කරගනු ලබන සම්පූර්ණ පීඨ සංඛ්‍යාවට සමාන කථිකාචාර්යවරුන් සහ සහකාර කථිකාචාර්යවරුන් ප්‍රමාණයක් ; සහ

(iii) අදාළ පීඨ මණ්ඩල මගින් නිර්දේශ කරනු ලබන පරිදි වූ, අධ්‍යාපන, වෘත්තිමය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලනමය ක්ෂේත්‍රවල විශිෂ්ට සේවා සිදුකර ඇති තැනැත්තන් අතරින් මණ්ඩලය විසින් පත් කරනු ලබන, සම්පූර්ණ පීඨ සංඛ්‍යාවට සමාන යම් සාමාජිකයන් සංඛ්‍යාවක්.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරා පත් කර ගනු ලැබූ හෝ පත්කරන ලද සෑම සාමාජිකයෙක් ම අවස්ථාචෝචිත පරිදි ඔහුගේ තෝරා පත් කර ගැනීමේ හෝ පත්වීමේ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලයක් සඳහා එම ධුර දැරිය යුතු ය.

(3) ශාස්ත්‍රීය සභාවේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(4) ශාස්ත්‍රීය සභාව අවශ්‍ය වූ කවර අවස්ථාවක දී හෝ රැස්විය යුතු අතර, එක් එක් වර්ෂයක දී අවස්ථා දහයකට අඩු නොවන අවස්ථා ප්‍රමාණයක් සඳහා එසේ රැස්විය යුතු ය.

(5) උපකුලපතිවරයා ශාස්ත්‍රීය සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු ශාස්ත්‍රීය සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මූලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් සාමාජිකයකු එම රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

ශාස්ත්‍රීය සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

24. (1) ශාස්ත්‍රීය සභාව විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අධිකාරිය විය යුතු අතර, මේ පනතේ සහ වෙනත් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ ප්‍රමිතීන්, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග සම්බන්ධයෙන් පාලනය සහ සාමාන්‍ය විධානය, ශාස්ත්‍රීය සභාවට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් ශාස්ත්‍රීය සභාව වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය සභාව විසින් පහත

දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:—

(i) උචිත අවස්ථාවන්හි දී අදාළ පීඨය හෝ පීඨ විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තා සලකා බැලීමෙන් අනතුරුව, අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ එම අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් මණ්ඩලයේ අනුමැතිය සඳහා මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ii) අදාළ පීඨය හෝ පීඨ විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තා සලකා බැලීමෙන් අනතුරුව, විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම්, මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(iii) විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු, මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ සහකාර කථිකාචාර්ය තනතුරු පිහිටුවීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීමට අදාළ යම් යෝජනා පිළිබඳව පීඨ මණ්ඩලයක් විසින් කරනු ලබන ඉල්ලීමක් අගැයීම සහ ඒ සම්බන්ධයෙන් වූ නම් නිර්දේශ තක්සේරු සංගතික සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(iv) අදාළ පීඨය හෝ පීඨ විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තා සලකා බැලීමෙන් අනතුරුව:—

(අ) දැනට පවත්නා පීඨ ප්‍රතිසංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ආ) අධ්‍යයන විෂයයන් අදාල පීඨවලට පැවරීම.

පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කිරීමේ ක්‍රම සහ කොන්දේසි පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(vi) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(vii) ශාස්ත්‍රීය සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි එම සභාවේ සාමාජිකයන් අතරින් ස්ථාවර කමිටු සංඛ්‍යාවක් හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් හෝ මණ්ඩල සංඛ්‍යාවක් පත් කිරීම සහ විශේෂයෙන් ම පහත දැක්වෙන කමිටු පත් කිරීම:—

(අ) මාධ්‍ය සහ තොරතුරු සේවා කමිටුව ;

(ආ) පර්යේෂණ කමිටුව ;

(ඇ) කර්මාන්ත - විශ්වවිද්‍යාල හවුල් සම්බන්ධතා කමිටුව ;

(ඈ) විෂයමාලා සහ අගැයීමේ කමිටුව ; සහ

(ඉ) නිවාඩු සහ ප්‍රධාන කමිටුව ;

(viii) (vii) වන ඡේදය යටතේ පත්කරනු ලබන කමිටු සහ මණ්ඩලවල විෂය කරුණු නිශ්චිතව දැක්වීම සහ වෙනස් කිරීම් සහිතව හෝ නොමැතිව එම කමිටු හෝ මණ්ඩල විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා අනුමත කිරීම හෝ එම වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ix) යම් අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමට අදාළව පීඨ මණ්ඩලයක් විසින් ඉදිරිපත් කරනු ලබන යම් යෝජනා පිළිබඳ තම නිර්දේශ ද සමග එම යෝජනා තත්ත්ව සහතික සභාව වෙත යොමු කිරීම; සහ

(x) තම ඉගැන්වීම්, පර්යේෂණ සහ ව්‍යාපෘති වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය බවට ශාස්ත්‍රීය සභාව විසින් සලකනු ලබන පීඨ පිහිටුවීම සම්බන්ධයෙන් කලින් කල මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

පීඨ මණ්ඩල.

**25**. (1) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පීඨයේ පීඨාධිපතිවරයා ;

(ආ) පීඨයේ සියලුම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන් ;

(ඈ) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම, ප්‍රතිනතාය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ඇ) අධ්‍යක්ෂ, මාධ්‍ය සහ තොරතුරු සේවා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ඉ) (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන් හැර, පීඨයේ ඉගැන්වීමේ කටයුතුවල නියුතු ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් ඔවුන් විසින් තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඊ) පීඨයේ ශිෂ්‍යයන් අතුරින් ඔවුන් විසින් තෝරා පත්කර ගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක් ; සහ

(උ) පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල නියුතු, කර්මාන්තයේ විශිෂ්ටත්වයක් ලබා ඇති පුද්ගලයන් අතුරින් පීඨය විසින් තෝරා පත්කර ගනු ලබන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන නොවන තැනැත්තන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්.

(2) තමා තෝරා පත්කර ගැනීමේ දින සිට ගණන් බලනු ලබන එක් අවුරුද්දක කාලසීමාවක් සඳහා (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන සාමාජිකයකු ධුර දැරිය යුතු අතර, තෝරා පත් කරගත් අනික් සියලුම සාමාජිකයන් එසේ ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) පීඨාධිපතිවරයා පීඨ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු පීඨ මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු ය. පීඨාධිපතිවරයාට එවැනි යම් රැස්වීමක මූලසුන දැරිය නොහැකි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ තෝරා පත්කර ගත් සාමාජිකයකු හැර, පැමිණ සිටින වෙනත් සාමාජිකයකු එම රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(4) පීඨ මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් හරි අඩක් විය යුතු අතර, අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී එම මණ්ඩලය රැස්විය යුතු ය. එසේ වුව ද, එක් වර්ෂයක් තුළ දී එය වාර දහයකට අඩු නොවන වාර සංඛ්‍යාවක් එසේ රැස්විය යුතු ය.

පීඨ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**26**. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨ මණ්ඩලයක් විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය:—

(i) ශාස්ත්‍රීය සභාව විසින් පීඨ මණ්ඩලය වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම ;

(ii) ශාස්ත්‍රීය සභාවේ පාලනයට යටත්ව, වෘත්තීය සහ තාක්ෂණ අධ්‍යාපනයේ සහ පුහුණුවෙහි විවිධ ශාඛාවන්හි ඉගැන්වීම, විභාග සහ පර්යේෂණවලට අදාළ කරුණු විධිමත් කිරීම;

(iii) පීඨයේ අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳව ශාස්ත්‍රීය සභාව වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(iv) යම් විශේෂ විෂයයක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්ය සඳහා පීඨයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත්කිරීම ; සහ

(v) විභාග පරීක්ෂකවරුන් ලෙස පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් ශාස්ත්‍රීය සභාව වෙත නිර්දේශ කිරීම.

(2) 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන්, විභාග සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් පීඨය මගින් පවත්වනු ලබන යම් රැස්වීමකට සහභාගි නොවිය යුතු අතර, එවැනි යම් රැස්වීමක් එම සහභාගිවීම නොතකා යථාපරිදි පවත්වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය

විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.

**27**. (1) සෑම වර්ෂයකට ම වරක් උපාධි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කුලපතිවරයා විසින් අනුමත කරනු ලබන දිනයක හෝ දිනවල දී විශ්වවිද්‍යාලය විසින් උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කුලපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අවස්ථාවක දී, විශ්වවිද්‍යාලය විසින් විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ප්‍රථම උපාධි ප්‍රදානය කිරීම, ප්‍රදානෝත්සවයක් නොපවත්වා කරනු ලැබිය හැකි ය.

(3) උපාධි ප්‍රදානෝත්සවයක කාර්ය පටිපාටිය අතුරු ව්‍යවස්ථාව මගින් නියම කරනු ලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා පැමිණ සිටින විටක දී ඔහු විසින් උපාධි ප්‍රදානෝත්සවයක මුලසුන දැරිය යුතු ය. ජනාධිපතිවරයා නොපැමිණි විටක දී කුලපතිවරයා එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු අතර, ජනාධිපතිවරයා සහ කුලපතිවරයා යන දෙදෙනාම නොපැමිණි විටක දී උපකුලපතිවරයා මුලසුන දැරිය යුතු ය.

## VII වන කොටස

## විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය

**28.** තත් කාර්යය සඳහා නියමාවලි මගින් නියම කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටි සහ කාර්ය පටිපාටීන්වලට අනුකූලව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත්වීමක්ම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

*මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය පත්කිරීම.*

**29.** විශ්වවිද්‍යාලයේ සියලු ගුරුවරුන්ගේ සුදුසුකම් තත්ත්ව සහතික සභාව විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම්, අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී තත්ත්ව සහතික විමසා, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

*විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සුදුසුකම් තීරණය කිරීම.*

**30.** (1) පීඨය සඳහා අවශ්‍ය ගුරුවරුන්ගේ තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම සහ අත්හිටුවීමට අදාළ ලිඛිත යෝජනා ශාස්ත්‍රීය සභාව වෙත ඉදිරිපත් කිරීම, එක් එක් පීඨ මණ්ඩලයේ කාර්යය වන්නේ ය. එවැනි යෝජනා ශාස්ත්‍රීය සභාව විසින් සලකා බලා අගැයීමට භාජනය කළ යුතු අතර, ඉන් අනතුරුව එහි නිර්දේශ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

*විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම සහ අත්හිටුවීම.*

(2) විශ්වවිද්‍යාලයේ සියලු අනධ්‍යයන තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම සහ අත්හිටුවීමට අදාළ නිර්දේශ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(3) මණ්ඩලය විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවල දී විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරක් හෝ අනධ්‍යයන තනතුරක් ඇති කිරීමට, අහෝසි කිරීමට හෝ අත්හිටුවීමට පෙර, ඒ සම්බන්ධයෙන් තත්ත්ව සහතික සභාවේ උපදෙස් ලබා ගත හැකි ය.

පරිවාස කාලසීමාව සහ ස්ථිර කිරීම.

**31.** (1) ගුරුවරයකුගේ තනතුරකට කරනු ලබන සෑම පත්වීමක්ම, පළමු අවස්ථාවේ දී අවුරුදු තුනක පරිවාස කාල සීමාවක් සඳහා විය යුතු අතර, එම කාල සීමාව එක් වතාවකට අවුරුද්දක් බැගින් වූ අවුරුදු තුනක් නොඉක්මවන තවදුරටත් වූ කාල සීමාවක් සඳහා, මණ්ඩලය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය. පරිවාස කාලසීමාව අවසානයේ දී නියමාවලි මගින් නියම කර ඇති පරිදි උචිත බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා ඇති ස්ථිර කිරීම පිළිබඳ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව, පත්වීම ස්ථිර කරනු ලැබිය හැකි ය.

(2) අනධ්‍යයන තනතුරකට කරනු ලබන සෑම පත්වීමක්ම පළමු අවස්ථාවේ දී අවුරුදු තුනක පරිවාස කාලසීමාවක් සඳහා විය යුතු අතර, ඉන්පසු එම පත්වීම නියමාවලි මගින් නියම කර ඇති පරිදි ස්ථිර කිරීමේ උපමානවලට අනුකූලව, ස්ථිර කරනු ලැබිය හැකි ය.

ගුරුවරුන් සහ අනධ්‍යයන තනතුරක් දරන තැනැත්තන් විශ්‍රාමයාම.

**32.** (1) තම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇති ගුරුවරයකුගේ තනතුරක් දරන තැනැත්තකු, ඔහුට වයස අවුරුදු හැට සම්පූර්ණ වනතුරු හෝ ශාස්ත්‍රීය වර්ෂයක් අතරතුර ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කළහොත් එම ශාස්ත්‍රීය වර්ෂයේ අවසාන දිනය දක්වා, ධුර දැරිය යුතු අතර, ඉන් පසු ඔහු සේවයෙන් විශ්‍රාම ගොස් ඇති ලෙස සලකනු ලැබේ:

එසේ වුව ද, එම තනතුර දරන්නාගේ සේවය මණ්ඩලය විසින් පරීක්ෂණයක් පවත්වන තෙක්, විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරි පැහැර හැරීම යන වැරදි සඳහා කවර හෝ අවස්ථාවක දී අත්හිටුවනු ලැබිය හැකි අතර, එම පරීක්ෂණයෙන් පසුව ඔහු වරදකරු කරනු ලැබුවහොත්, මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මත එම තනතුර දරන්නා සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, වයස අවුරුදු හැට සම්පූර්ණ කර ඇති සහ මණ්ඩලයේ මතය අනුව එම තනතුර අඛණ්ඩව දැරීමට සුදුසු ගුරුවරයකු, අවුරුදු එකක කාලයක් සඳහා ගුරුවරයකු වශයෙන් සේවය කිරීමට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම තැනැත්තාට වයස අවුරුදු හැට පස සම්පූර්ණ වනතුරු ඔහුගේ සේවා කාලය එක් වරකට අවුරුද්දක් බැගින් තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) රජයේ සේවකයන්ගේ විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන් අදාළ වන්නා වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන, විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන තනතුරු දරන තැනැත්තන්ගේ විශ්‍රාම යෑමේ වයස සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම තනතුර දරන්නාගේ සේවය, මණ්ඩලය විසින් පරීක්ෂණයක් පවත්වනතෙක්, විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරි පැහැර හැරීම මත කවර හෝ අවස්ථාවක දී අත්හිටුවනු ලැබිය හැකි අතර, එම පරීක්ෂණයෙන් පසුව ඔහු වරදකරු කරනු ලැබුවහොත්, මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මත එම තනතුර දරන්නා සේවයෙන් පහකිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම කරනු ලැබිය හැකි ය.

(4) 31 වන වගන්තියේ සඳහන් පරිවාස කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙරාතුව —

(අ) ගුරුවරයකු වශයෙන් තනතුරක් දරන යම් තැනැත්තකුට වයස අවුරුදු හැට එළඹෙන අවස්ථාවක දී ; හෝ

(ආ) අනධ්‍යයන තනතුරක් දරන යම් තැනැත්තකු, (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නිශ්චිතව සඳහන් කරන ලද විශ්‍රාම යාමේ වයසට එළඹෙන අවස්ථාවකදී,

ඒ තැනැත්තා, එම වයසට එළඹුන දින සිට සේවයෙන් විශ්‍රාම ගෙන ඇති බවට සලකනු ලැබිය යුතු ය

(5) සේවයෙන් පහකරනු ලැබූ හෝ තම තනතුරෙන් අනිවාර්යයෙන් විශ්‍රාම යවනු ලැබූ හෝ විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරි පැහැර හැරීම මත අන්‍යාකාරයකට දඬුවම් කරනු ලැබූ විශ්වවිද්‍යාලයේ තනතුරක් දරන සෑම තැනැත්තෙක්ම, එසේ සේවයෙන් පහකිරීම හෝ විශ්‍රාම ගැන්වීම හෝ වෙනත් දඬුවමට එරෙහිව විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**රාජ්‍ය නිලධරයන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට පත් කිරීම.**

**33**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවය කරනු ලබන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, සහ එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චිත කරනු ලබන යම් කාලයක් සඳහා විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව, ගුරුවරයකු වශයෙන් ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරකට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරකට ස්ථිරව පත් කරනු ලැබූ රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට හා ඔහු සම්බන්ධයෙන් මේ පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් විශ්වවිද්‍යාලයට කරන ලද යම් සේවා කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනවල ගුරුවරුන් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**34**. මණ්ඩලයේ ඉල්ලීම පිට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුක්ත යම් ගුරුවරයකු, ඒ ගුරුවරයාගේ, සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරියේ කැමැත්ත ඇතිව, සහ එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා, විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව මණ්ඩලය හා එම උසස් අධ්‍යාපන ආයතනය එකඟ වන නියම හා කොන්දේසි මත, එම තනතුරට ස්ථිරව පත් කරනු ලැබිය හැකි අතර, ඔහු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ ගුරුවරයන්ට අදාළ විනය පාලනයටම යටත් විය යුතු ය.

## VIII වන කොටස

## විශ්වවිද්‍යාලයේ අභියාචන මණ්ඩලය

පරීක්ෂණ සහ විමර්ශන මඩුල්ලක් පත් කිරීම.

**35**. (1) ඉදිකිරීම්, නිෂ්පාදනය, ශාස්ත්‍රීය, පරිපාලනය, මූල්‍ය, නීති හෝ සේවා අංශවල දැනුමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින් නව දෙනෙකුට අඩු නොවන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන පරීක්ෂණ හා විමර්ශන මඩුල්ලක්, අමාත්‍යවරයා විසින් කලින් කල පත් කරනු ලැබිය යුතු ය.

(2) පරීක්ෂණ හා විමර්ශන මඩුල්ලේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු තම පත්වීමේ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා

ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(3) පරීක්ෂණ හා විමර්ශන මඩුල්ලේ සාමාජිකයකු හට අමාත්‍යවරයා වෙත අමතනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය

36. (1) (අ) යම් පත්වීමකට, උසස්වීමකට, සේවයෙන් පහකිරීමකට, සේවය අත්හිටුවීමකට, තමාට එරෙහිව ගනු ලැබූ විනයානුකූල ක්‍රියා මාර්ගයකට හෝ යම් වැටුප් විෂමතාවයකට එරෙහිව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක දී හෝ

විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සංයුතිය.

(ආ) විශ්වවිද්‍යාලයේ කර්තව්‍යවලට අදාළ යම් කටයුත්තක් පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමට අවශ්‍ය අවස්ථාවක දී,

අවස්ථාචෝචිත පරිදි එම අභියාචනය විභාග කිරීම සඳහා හෝ එම විමර්ශනය පැවැත්වීම සඳහා මණ්ඩලය විසින් 35 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පරීක්ෂණ සහ විමර්ශන මඩුල්ලට පත් කරන ලද තැනැත්තන් අතුරින් තෝරා ගනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයක් සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් විසින්, එම සාමාජිකයන් අතුරින් එක් අයකු එහි සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සඳහා වූ කාර්ය පටිපාටිය තත් කාර්ය සඳහා සාදන ලද රීති අනුව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාචෝචිත පරිදි, අභියාචනයක් විභාග කිරීම හෝ පැවැත්වීම අවසානයේ දී, විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණය සහ තීරණයට තුඩුදුන් සහ ඒ සඳහා වූ හේතු ඒ අභියාචනය හෝ විමර්ශනය පිළිබඳ වූ වාර්තාවක් ද සමග මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය. තව ද, එම තීරණයෙහි සහ තීරණයට තුඩුදුන් හේතුවල පිටපතක් අභියාචන ඉදිරිපත් කිරීම කරනු ලැබූ තැනැත්තා වෙත ද, ඒ තීරණයට එළඹීමෙන් සතියක් ඇතුළත, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන දීමනාවක්, අභියාචන මණ්ඩලය විසින් පවත්වනු ලබන එක් එක් අභියාචනය විභාග කිරීමක් වෙනුවෙන් හෝ විමර්ශනයක් පැවැත්වීම වෙනුවෙන්, විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණයට එරෙහිව අභියාචන කිරීම

**37**. 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා විසින් 36 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ, එම තීරණය සහ ඊට තුඩු දුන් හේතූන් තමා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව.

**38**. (1) යම් අධිකරණයක් ඉදිරිපිට දී විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයට ගෙවනු ලබන හෝ එය විසින් අය කර ගනු ලබන යම් නඩු ගාස්තුවක්, එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, යම් අධිකරණයක් ඉදිරිපිට දී ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම සාමාජිකයා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබ ඇති බවට අධිකරණය තීරණය කළහොත්, එම වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබුවහොත් මිස, විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

## IX වන කොටස

## මුදල්

විශ්ව විද්‍යාල අරමුදල

**39**. (1) විශ්වවිද්‍යාලයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, එම අරමුදලට–

(අ) 40 වන සහ 46 වන වගන්ති යටතේ පාර්ලිමේන්තුව විසින් එහි ප්‍රයෝජනය සඳහා සපයනු ලබන සියලු මුදල් ;

(ආ) කවර හෝ ප්‍රභවයකින් පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ප්‍රකාරව විශ්ව විද්‍යාලය වෙත ගෙවනු ලැබූ ගාස්තු, සහ ;

(ඈ) මේ පනත යටතේ සාදන ලද යම් රීතියකට හෝ නියෝගයකට අනුව විශ්වවිද්‍යාලය වෙත ගෙවීමට නියමිත වෙනත් යම් මුදලක්,

බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී විශ්ව විද්‍යාලය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, විශ්ව විද්‍යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විශ්ව විද්‍යාලයට ආධාර වශයෙන් කරනු ලබන ප්‍රදාන.

40. වාර්ෂික විසර්ජන වශයෙන්, පරිපූරක ඇස්තමේන්තු වශයෙන් හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාලයට ආධාර ලෙස ලබාදෙන යම් මුදල් ප්‍රමාණයක්, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් එක් එක් මුදල් වර්ෂය ආරම්භවීමෙන් පසු, ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මණින් විශ්වවිද්‍යාලය වෙත ලබාදිය යුතු ය.

අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන, මණ්ඩලය විසින් සලකා බැලිය යුතු බව.

41. 42 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ අධ්‍යක්ෂ, මුදල් ගේ සහය ඇතුව පිළියෙල කරනු ලබන විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි දිනකට පෙර මණ්ඩලය විසින් සලකා බැලිය යුතු ය. මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන වෙනස් කිරීම් එම ඇස්තමේන්තුවලට සහ මුදල් විසර්ජනවලට සිදු කරනු ලැබිය හැකි අතර, නිම වූ මුදල් වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග එම ඇස්තමේන්තු සහ විසර්ජන, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී එම ඇස්තමේන්තු සහ මුදල් විසර්ජනය සංශෝධන කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ, මුදල්, විසින් කළ යුතු කාර්යයන්.

42. (අ) රීති මගින් නියම කරනු ලබන ආකෘතියකට අනුව සහ එවැනි ආකාරයකට විශ්වවිද්‍යාලයේ ගිණුම් තබා ගැනීම ;

(ආ) විශ්වවිද්‍යාලයේ අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ලබා ගැනීම සහ එම මුදල් සුදුසු ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(ඈ) සියලු බලය ලත් ගෙවීම් සිදු කිරීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන සකස් කිරීමෙහි ලා මණ්ඩලයට සහායවීම ; සහ

(ඉ) අවශ්‍ය අවස්ථාවන්හි දී මේ පනතේ 46 වන වගන්තිය යටතේ යම් පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම,

විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මුදල්, විසින් ඉටු කළ යුතු කාර්යය වන්නේ ය.

විශේෂ කාර්ය සඳහා වූ ප්‍රදානවලින් ලැබෙන ආදායම වෙන් වශයෙන් ගිණුම් තැබිය යුතු බව.

**43.** විශේෂ කාර්ය සඳහා ලබා දුන් ප්‍රදානවලින් හෝ විශේෂ අරමුණු උදෙසා වූ පරිත්‍යාගවලින් විශ්වවිද්‍යාලයට ලැබෙන ආදායම විශ්ව විද්‍යාලයේ ගිණුම්වල වෙන් වශයෙන් ගිණුම් තැබිය යුතු අතර, එම ආදායමෙන් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ එම ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, එම කාර්ය හෝ අරමුණු හැර වෙනත් කාර්ය හෝ අරමුණු සඳහා, කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන මණ්ඩලය විසින් සම්මත කළ යුතු බව.

**44.** විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු, වාර්ෂික මුදල් විසර්ජන සහ වාර්ෂික ගිණුම්, 41 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට පෙර, මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් සම්මත කර ගනු ලැබිය යුතු ය.

එක් වැය ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට අරමුදල් මාරු කිරීම.

**45.** භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමට යටත්ව, අවශ්‍ය අවස්ථාවන්හි දී මණ්ඩලය විසින් වාර්ෂික ඇස්තමේන්තුවල එක් වැය ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට අරමුදල් මාරු කිරීම, නීත්‍යනුකූල වන්නේ ය.

පරිපූරක ඇස්තමේන්තු.

**46.** (1) අවශ්‍ය අවස්ථාවන්හි දී සහ අනපේක්ෂිත වියදමක් පියවීම සඳහා, අධ්‍යක්ෂ, මුදල්, විසින් කලින් කල වියදම් පිළිබඳ පරිපූරක ඇස්තමේන්තු සකස් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන පූර්ව අනුමැතියකින් තොරව, පුනරාවර්තන ස්වභාවයේ මූල්‍ය වැය බරක් දරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරනු ලබන පරිපූරක ඇස්තමේන්තු මණ්ඩලය විසින් සම්මත කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, සම්මත කිරීමෙන් අනතුරුව එම ඇස්තමේන්තු ඉදිරි වර්ෂය සඳහා වූ වාර්ෂික විසර්ජන සමග අමාත්‍යවරයා වෙත ලබා දිය යුතු ය.

47. (1) විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. — මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

48. එක් එක් මුදල් වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කරනු ලැබූ විට, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. — විගණනය කරන ලද ගිණුම් පළ කිරීම.

49. (1) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබීමෙන් මාස තුනක් ඇතුළත, විශ්වවිද්‍යාලය විසින් එම වාර්තාවට අදාල වන ගිණුම් ප්‍රකාශ සමගින් එම වාර්තාව සහ ඒ වාර්තාව පිළිබඳව මණ්ඩලය විසින් කරන ලද මත ප්‍රකාශ කිරීම්, අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය. — වාර්ෂික ගිණුම් සහ විගණකාධිපති වරයාගේ වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත යවන ලද සියලු ලේඛනවල පිටපත්, එම ගිණුම් සහ වාර්තා අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසන් වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු සකස් කරනු ලැබිය යුතු ය. විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා, පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියට පැමිණ ඒ සම්බන්ධයෙන් පැන නගින ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

## X වන කොටස

### ශිෂ්‍ය සභාව සහ වෙනත් සාංගම්

50. (1) විශ්වවිද්‍යාලයේ තත්කාලයේ ශිෂ්‍යයන් වන තැනැත්තන් අතරින් තෝරා පත් කර ගනු ලබන ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත වන ශිෂ්‍ය සභාවක්, විශ්වවිද්‍යාලයට තිබිය යුතු ය. — ශිෂ්‍ය සභාව.

(2) උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එක් එක් ශාස්ත්‍රීය වර්ෂය ආරම්භයේ දී පවත්වනු

ලබන රහස් ඡන්දයක් මගින්, ශිෂ්‍ය සභාව සඳහා වූ සෑම ඡන්ද විමසීමක්ම පවත්වනු ලැබිය යුතු ය.

(3) ශිෂ්‍ය සභාවක් තෝරා පත්කර ගනු ලැබූ ශාස්ත්‍රීය වර්ෂය අවසානයේ දී, එම ශිෂ්‍ය සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවසන් විය යුතු ය.

ඇතැම් සමිති සහ වෙනත් සංගම් පිළිගත යුතු බව.

**51**. (1) ශාස්ත්‍රීය හෝ සාමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා පමණක් පිහිටුවනු ලැබූ ශිෂ්‍යයන්ගේ යම් සමිති හෝ ඔවුන්ගේ වෙනත් සංගම් මණ්ඩලය විසින් පිළිගනු ලැබිය හැකි අතර, තත් කාර්ය සඳහා සාදන ලද අතුරු ව්‍යවස්ථා මගින් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කටයුතු හෝ කර්තව්‍ය, එම සමිති හෝ වෙනත් සංගම් විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ යම් සමිතියක හෝ වෙනත් සංගමයක සාමාජිකත්වය, සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) 53 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ පිළිගනු ලබන සමිති සහ වෙනත් සංගම් ලියාපදිංචි කිරීමේ ක්‍රමය, ඒවායේ කර්තව්‍ය, ඒවායේ නිලතල දරන්නන් පත් කිරීම සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමේ ක්‍රමය සහ එම නිලතල දරන්නන්ගේ කාර්යය සහ කර්තව්‍ය, මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

අනුමත කටයුතු සඳහා ශිෂ්‍ය සභාව යනාදියට මණ්ඩලය විසින් මුදල් වෙන් කළ යුතු බව.

**52**. අනුමත කටයුතු සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන මුදල් ප්‍රමාණයන්, ශිෂ්‍ය සභාවට හෝ 51 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ ශිෂ්‍ය සමිතියකට හෝ වෙනත් සංගමයකට, මණ්ඩලය විසින් කලින් කල වෙන් කර දිය හැකි ය.

ශිෂ්‍ය සභාවේ ව්‍යවස්ථාව, කාර්යය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් නියම කළ යුතු බව.

**53**. මණ්ඩලය විසින් නියමාවලි මගින්—

(අ) ශිෂ්‍ය සභාවේ කාර්ය සහ කර්තව්‍ය ;

(ආ) ශිෂ්‍ය සභාවේ නිලතල දරන්නන් සහ ශිෂ්‍ය සභාව සංයුක්ත වන ශිෂ්‍ය නියෝජිතයන් සංඛ්‍යාව සහ ඔවුන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය ;

(ඈ) ශිෂ්‍ය සභාවේ නිලතල දරන්නන්ගේ කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) ශිෂ්‍ය සභාව විසින් පත් කරනු ලැබිය හැකි ස්ථාවර කමිටුව හෝ කමිටු සහ එම කමිටුවේ හෝ කමිටුවල කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) ශිෂ්‍ය සභාවට සහ 51 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් පිළිගනු ලබන යම් සමිතියකට හෝ වෙනත් සංගමයකට වෙන් කරන ලද අරමුදල් භාවිත කළ යුතු කාර්යය හෝ කාර්යයන් ; සහ

(ඊ) ශිෂ්‍ය සභාවේ සහ යම් සමිතියක හෝ වෙනත් සංගමයක ගිණුම් පවත්වාගෙන යා යුතු සහ විගණනය කළ යුතු ආකාරය සහ පිළිවෙත,

නියම කළ යුතු ය.

54. (1) ශිෂ්‍ය සභාව හෝ යම් සමිතියක් හෝ වෙනත් සංගමයක් උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට අහිතකර හෝ හානිදායක වන ආකාරයකට කටයුතු කරන අවස්ථාවක හෝ මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන අවස්ථාවක දී, උපකුලපතිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, එම ශිෂ්‍ය සභාව, සමිතිය හෝ වෙනත් සංගමය අත්හිටුවීම හෝ විසුරුවා හැරීම කරනු ලැබිය හැකි ය. ශිෂ්‍ය සභාව, සමිතියක් හෝ වෙනත් සංගමයක් අත්හිටුවීම හෝ විසුරුවා හැරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ ශිෂ්‍ය සභාව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, උපකුලපතිවරයා විසින් 50 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව නව ශිෂ්‍ය සභාවක් තෝරා පත්කර ගැනීමේ කාර්ය සඳහා දිනයක් නියම කරනු ලැබිය හැකි ය. එම නව ශිෂ්‍ය සභාව තෝරා පත්කර ගනු ලැබුවේ යම් ශාස්ත්‍රීය වර්ෂයක් සඳහා ද, එම ශිෂ්‍ය සභාව, ඒ ශාස්ත්‍රීය වර්ෂයේ අවසානය දක්වා ධුරය දැරිය යුතු ය.

## XI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

55. යම් තැනැත්තකු— විශ්වවිද්‍යාලයේ යම් නිලධරයෙකු සහ සාමාජිකයන්වීමට නුසුදුසුකම්.

(අ) ඔංකොලොත් භාවයෙන් හෝ බුන්වත් භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තෙක් නම් ;

(ආ) චරිත දූෂණ වරදක් ඇතුළත් වන යම් වරදකට ඔහු වරදකරු වී ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ ඔහු සිහිවිකල් පුද්ගලයකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් ;

(ඈ) තමාගේ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම හැර, විශ්වවිද්‍යාලය විසින් හෝ එය වෙනුවෙන් ඇති කර ගත් යම් ගිවිසුමක් යටතේ සෘජුවම හෝ අන්‍යාකාරයකින් ඔහු විසින් ම හෝ වෙනත් තැනැත්තකු මගින් හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහුගේ ප්‍රයෝජනය හෝ ප්‍රතිලාභය සඳහා යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ;

(ඉ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නේ නම් හෝ වුවහොත් හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වන්නේ නම් හෝ වුවහොත් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත් ;

(ඊ) විෂමාචාරය සඳහා ඔහු විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක සාමාජිකත්වයෙන් හෝ යම් ධුරයකින් ඉවත් කරනු ලැබ ඇත්නම් ;

(උ) රෝගාතුරභාවයක් හෝ කායික හෝ මානසික අශක්නුතාවයක් හේතුවෙන් අධිකාරියේ සාමාජිකයකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීමට හෝ අඛණ්ඩව ධුරයක් දැරීමට නුසුදුසු යයි සොයාගනු ලැබූ අවස්ථාවක ;

(ඌ) විෂමාචාරය හෝ දූෂණය සම්බන්ධයෙන් වරදකරුවකු කරනු ලැබූ අවස්ථාවක ; හෝ

(එ) ඔහුගේ ධුරයේ බලතල බරපතල ලෙස අනිසි ආකාරයෙන් යොදා ගැනීම සම්බන්ධයෙන් වරදකරුවකු කරනු ලැබූ අවස්ථාවක.

එම තැනැත්තා විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක සාමාජිකයකු වශයෙන් හෝ විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

**56**. විශ්වවිද්‍යාලයේ සියලු නිලධරයන් හා එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**57**. විශ්වවිද්‍යාලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**58**. (1) විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, කාර්ය මණ්ඩල සාමාජිකයකු හෝ ශිෂ්‍යයකු නොවන වෙනත් තැනැත්තකු, විශ්වවිද්‍යාලය තුළ සිටීම උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයෙහි හෝ එහි ශිෂ්‍යයන්ගේ ශුභසාධනයට යෝග්‍ය නොවන අවස්ථාවක දී, කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් එම තැනැත්තාට ලබාදීමෙන් පසු සහ මණ්ඩලයේ කැමැත්ත ඇතිව, උපකුලපතිවරයා විසින් තම අත්සන යටතේ වූ දැන්වීමක් එම තැනැත්තා වෙත භාර දෙමින් විශ්වවිද්‍යාල භූමියට හෝ එම දැන්වීමේ සඳහන් විශ්වවිද්‍යාලයේ යම් කොටසකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම තහනම් කරනු ලැබිය යුතු ය. එම තහනම මණ්ඩලය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරන තෙක් වලංගුව පැවතිය යුතු ය.

නොමනා පුද්ගලයන් විශ්වවිද්‍යාල භූමියට ඇතුළුවීම තහනම් කිරීම.

(2) සහතිකයේ නම් කර ඇති යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව විශ්වවිද්‍යාල භූමියට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම තහනම් කර ඇති බවට උපකුලපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක්, එම සහතිකයට පටහැනිව කරුණු ඔප්පු කරන තෙක්, එම සහතිකයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂියක් වශයෙන් යම් අධිකරණයක් විසින් පිළිගැනීම සහ භාරගැනීම කළ යුතු ය.

(3) උපකුලපතිවරයා විසින් නිකුත් කරනු ලැබ ඔහු විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් බවට උද්දේශිත යම් ලේඛනයක් සාක්ෂි වශයෙන් භාරගත යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරන තෙක් එය (2) වන උපවගන්තිය යටතේ උපකුලපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් බවට සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල භූමියට හෝ එහි කොටසකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම තහනම් කරනු ලැබ එම තහනම උල්ලංඝනය කරමින් සාධාරණ හේතුවක් නොමැතිව විශ්ව විද්‍යාල භූමියට හෝ එහි කොටසකට ඇතුළුවන හෝ රැඳී සිටින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, එම භූමියට හෝ එහි යම් කොටසකට ඇතුළු වී එහි රැඳී සිටි එක් එක් දිනයක් හෝ එහි කොටසක් සම්බන්ධයෙන්, රුපියල් එක් දහසක දඩයකට ඔහු යටත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ වරදක්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් සහ ඇප දිය හැකි වරදක් විය යුතු ය.

ලිඛිත ව්‍යවස්ථා.

59. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණාවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ලිඛිත ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :—

(අ) අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක පුරප්පාඩු පිරවීම සහ එහි රැස්වීම් කැඳවීම ;

(ආ) ප්‍රදානය කළ යුතු උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම ;

(ඇ) ගෞරව උපාධි හෝ වෙනත් විශිෂ්ටතා පිරිනැමීම ;

(ඈ) කවර හෝ ආකාරයකින් සපයනු ලැබිය හැකි අරමුදල් හෝ දේපළවලින්, අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ; සහ

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ ලිඛිත ව්‍යවස්ථා සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති සියලු කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම ලිඛිත ව්‍යවස්ථාවක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම ගැසට් පත්‍රයේ දිනයේ සිට හෝ එහි සඳහන් වෙනත් දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

60. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ යම් කාරණාවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :— අතුරු ව්‍යවස්ථා.

(අ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ;

(ආ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගත යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි සහ නියම කර ඇති විභාග ;

(ඇ) අධ්‍යයන පාඨමාලා, විභාග, උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා ගාස්තු අය කිරීම ;

(ඈ) විශ්වවිද්‍යාලයේ විවිධ බල මණ්ඩලවලට සහ වෙනත් මණ්ඩලවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීම හා අදාළ සියලු කාරණා ;

(ඉ) විභාග පරීක්ෂකවරුන් සඳහා වූ කොන්දේසි, ඔවුන් පත් කිරීමේ ක්‍රමය, ඔවුන්ගේ කාර්ය සහ ඔවුන්හට ගෙවිය යුතු ගාස්තු හා විභාග පැවැත්වීම සහ ඒවායේ ප්‍රමිති පවත්වාගෙන යාම ; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති සියලු කාරණා.

(2) ශාස්ත්‍රීය සභාව විසින් අදාළ අතුරු ව්‍යවස්ථාවල කෙටුම්පතක් සකස් කොට මණ්ඩලය වෙත පළමුව ඉදිරිපත් කරන තෙක්, විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම හෝ විභාගවලට අදාළ හෝ ඊට සම්බන්ධ යම් කාරණාවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, එහි සඳහන් යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

නියෝග.

**61.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එහි සඳහන් යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

රීති.

**62.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනතේ විධිවිධාන යටතේ රීති සෑදීමට නියම කර ඇත්තේ යම් කාරණා සඳහා ද, එම කාරණා ; සහ

(ආ) මේ පනත යටතේ සිය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට එම බලමණ්ඩලයට හැකිවීම පිණිස සැලසීමට නියමිත සියලු කාරණා සම්බන්ධයෙන්.

(2) (1) වන උපවගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලයක් විසින් සාදනු ලබන රීති, එහි සඳහන් යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

**63.** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන, මේ පනත මගින් පිහිටුවන ලබන විශ්වවිද්‍යාලයට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## XII වන කොටස

## අර්ථ නිරූපණය.

අර්ථ නිරූපණය.

**64.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව සාදන ලද යම් නියමාවලියක්, ලිඛිත ව්‍යවස්ථාවක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

"බලමණ්ඩලයක්" යන්නෙන්, මේ පනතේ 17 වන වගන්තියේ සඳහන් යම් බලමණ්ඩලයක් අදහස් වේ ;

"අකුරු ව්‍යවස්ථාවක්" යන්නෙන්, මේ පනතේ 60 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද අකුරු ව්‍යවස්ථාවක් අදහස් වේ ;

"උපාධිය" යන්නෙන්, විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි යන දෙකම අදහස් වේ ;

"අනධ්‍යයන කාර්ය මණ්ඩලය" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් හැර, අනිකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් අදහස් වේ ;

"නියමාවලි" යන්නෙන්, මේ පනතේ 20 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද යම් නියමාවලි අදහස් වේ ;

"ප්‍රධාන විධායක නිලධාරියා" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ ;

"නියෝගය" යන්නෙන්, මේ පනතේ 61 වන වගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව විසින් සාදනු ලබන යම් නියෝගයක් අදහස් වේ ;

"රීතිය" යන්නෙන්, මේ පනතේ 62 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් විසින් සාදනු ලබන යම් රීතියක් අදහස් වේ ;

"ලිඛිත ව්‍යවස්ථාව" යන්නෙන්, මේ පනතේ 59 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන යම් ලිඛිත ව්‍යවස්ථාවක් අදහස් වේ ; සහ

"ගුරුවරයා" යන්නෙන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක්, මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, කථිකාචාර්යවරයෙක් සහ සහකාර කථිකාචාර්යවරයෙක් අදහස් වේ.

**65.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

විශ්වවිද්‍යාලය පිහිටුවීමතුරු විශේෂ විධිවිධාන

**66.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ පීඨ ඇති කිරීම සහ සංවිධානය කිරීම, විවිධ බලමණ්ඩල සංස්ථාපනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ නිලධරයන් සහ වෙනත් කාර්ය මණ්ඩල පත් කිරීම සිදු කරන තෙක්, අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන අන්තර් කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය :—

(අ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයා වශයෙන් ක්‍රියා කළ යුතු වූ ද, ඉදිකිරීම්, නිපදවීම් හෝ වෙනත් තාක්ෂණ ක්ෂේත්‍රයක හෝ සේවා අංශයක ශාස්ත්‍රීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තැනැත්තෙක් ; සහ

(ආ) 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එහි වෙනත් එක් අධ්‍යක්ෂවරයකු.

(2) මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අන්තර් කමිටුව නියමිත දිනයේ සිට ආරම්භ වන මාස හයක කාලයක් සඳහා කටයුතු කරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ විශ්වවිද්‍යාලයට සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සහ එකී මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවීම පිණිස අවශ්‍ය සියලු පියවර සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද වගකිව යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී අන්තර් කමිටුවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, උපකරණ, ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් වෙන්කර දීම සහ එක් එක් පීඨයේ ව්‍යුහය සහ සංයුතිය හා එක් එක් පීඨයට වෙන් කර දිය යුතු අධ්‍යාපන පාඨමාලා සහ විෂයයන්, නිශ්චය කිරීම ; සහ

(ආ) විශ්වවිද්‍යාලයට අදාළ වන යම් කරුණක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ මණ්ඩලයේ සහ වෙනත් යම් බලමණ්ඩලයක බලතල ක්‍රියාත්මක කිරීම සහ එම කාලසීමාව තුළ දී විශ්වවිද්‍යාලයේ කර්තව්‍ය සංවිධානය කිරීමේ, ඉටු කිරීමේ සහ මෙහෙයවීමේ කාර්ය සඳහා මේ පනත යටතේ නම් කරන ලද නිලධරයන් ද ඇතුළුව, යම් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කිරීම.

(4) (2) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලසීමාව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් මාස හයකට වැඩි නොවන තවදුරටත් වූ කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. එම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාසයක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත එහි අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නිවේදනයක්, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතු ය

(5) යම් නිවේදනයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**67.** (1) 66 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද ප්‍රථම උපකුලපතිවරයා, ස්වකීය ධුර කාලය තුළ දී විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් මේ පනත යටතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක් යටතේ උපකුලපතිවරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන් කර දී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයා සහ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) විශ්වවිද්‍යාලයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මුදල්, 66 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලය ඇතුළත කවර හෝ අවස්ථාවක දී, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට ස්වකීය ධුර කාලය තුළ දී, විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් මේ පනත සහ වෙනත් උචිත සාධන පත්‍රයක් යටතේ පවරා ඇති හෝ පනවා ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

**68.** (1) 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතන පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම පනත මගින් පිහිටුවන ලද (මේ වගන්තියෙහි "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් වන්නා වූ ද, නියමිත දිනයේ දී එම ආයතනයේ කාර්ය මණ්ඩලයේ සිටින්නා වූ ද නිලධරයන් සහ සේවකයන්, නියමිත දිනයේ සිට මාස දෙකක කාලයක් ඉකුත් වීමට පෙර, 66 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයා වෙත අමතනු ලබන ලිඛිත නිවේදනයක් මගින්

ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ නිලධරයන්ට සහ සේවකයන්ට විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය ලබා දිය යුතු බව.

ඔහුට හෝ ඇයට විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය ලබා දෙන්නේ නම්, එසේ විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය එම නිලධරයා හෝ සේවකයා විසින් භාර ගන්නේ ද නැද්ද යන්න ගැන එම උපකුලපතිවරයාට දැනුම් දිය යුතු ය.

(2) ප්‍රථම උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාලයෙහි සේවා නියුක්තියක් පිළිගනු ලබන සහ එම සේවා නියුක්තිය භාර ගැනීමට කැමැත්ත පළකරන එම ආයතනයේ සියලු නිලධරයන් සහ සේවකයන්, 69 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් දිනයේ සිට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් බවට පත්වන අතර, ආයතනයේ ඔවුන්ගේ සේවා නියුක්තියට අදාළ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන සේවා කොන්දේසි මත, සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු -

(අ) විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය භාර නොගන්නා බවට ප්‍රකාශ කරන අවස්ථාවක ; හෝ

(ආ) විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය භාර ගැනීමට කැමැත්ත පළ කළත්, ආයතනයෙහි ඔහු විසින් ඉටු කරන ලද සේවයෙහි ස්වභාවය අනුව ඔහු විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට නොහැකි වන අවස්ථාවක,

69 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් දිනයේ සිට එම නිලධරයා හෝ සේවකයා සේවයෙන් විශ්‍රාම ගිය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු විශ්‍රාම යාමේ වයසට එළඹීමෙන් පසු ආයතනයේ සේවයෙන් විශ්‍රාම ගත්තේ නම් ඔහුට හිමිකම් ඇති විශ්‍රාම ප්‍රතිලාභ ලබාගැනීමට ද, ඔහු සුදුස්සකු වන්නේ ය.

1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතන පනත ඉවත් කිරීම.

**69.** (1) 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයක සිට ඉවත් කරනු ලැබිය යුතු අතර, එසේ නිශ්චිතව දක්වනු ලබන දිනය නියමිත දිනයේ සිට මාස හයකට පසුව, එහෙත් මාස දොළහක් ඇතුළත, එළඹෙන දිනයක් විය යුතු ය.

(2) මේ පනතෙ ඉහත කී පරිදි ඉවත් කිරීම නොතකා, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව දැක්වෙන දිනයේ සිට සහ එදිනට පසුව :—

(අ) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ සියලු චංචල සහ නිශ්චල දේපළ, (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් දිනයේ සිට විශ්වවිද්‍යාලය වෙත පැවරේ ;

(ආ) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය විසින් හෝ එය සමග එළඹුන සහ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්, විශ්වවිද්‍යාලය විසින් හෝ එය සමග එළඹුන කොන්දේසි සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙරාතුව වූ දිනයේ දී ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ අරමුදලේ බැරට තිබූ සියලු මුදල්, එම දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනතේ 39 වන වගන්තිය මගින් පිහිටුවන ලද අරමුදලට බැර කරනු ලැබිය යුතු ය ; සහ

(ඈ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙරාතුව ම වූ දිනයේ ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ පවතින සියලු බැරකම් විශ්වවිද්‍යාලයේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.